Seafood Exporters' Association of Sri Lanka
SEASL

# නිල් පිහිනුම් කකුළුවෝ පුවත් හසුන අංක 3


*2015ජනවාරි සිට ජුනි දක්වා*

ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයන කරුවන්ගේ සංගමය (SEASL) සමගින් (FIP) වැඩසටහන පලකරනු ලබන *නිල් කකුළුවෝ පුවත් හසුනෙහි* තුන්වන කලාපය සමගින් යලිත්වරක් ඔබ හමුවන්නේ ඉතාමත්ම සතටු සිතකින් යුක්තවය. පසුගිය මාස හයක කාලය නිල්කකුළු ධීවර කකර්මාන්තයේ සංවර්ධනය අතින් වඩාත් කාර්යය බහුල වැඩසටහන් රැසක් ඉටුකරනලද කාල පරිච්ජේදයක් ලෙස සදහන් කලහැකිය . කකුළුවන්ගේ බෝවීම කොපමණද යන්න තක්සේරු කිරීම සදහා පරයේක්ෂනයන් ස්ථාන දෙකකදී සිදු කරන ලද අතර මෙම පරයේක්ෂනයන් දෙක සදහා පුනරීන් ධීවර සමූපකාර සංගමය පුර්ණ සහයෝගය ලබාදෙන ලදී . නාරා ආයතනය සහ ධීවර හා ජලජ සම්පත්සංවර්ධන දෙපාර්ථමේන්තුව සමග සහයෝගයෙන් කකුළුවන් පිළිබදව ජෛවවිද්‍යාත්මක පරයෙක්ෂණයද සිදුකරන ලදී .ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ සහයෝගය ලබාගනිමින් එෆ්'අයිපී (ධීවර කටයුතු සංවර්ධන ව්‍යාපෘතිය) සමග අනුබද්දව නිල්කකුළු ධීවරකර්මාන්තයට අදාල දත්ත රැස්කිරිමේසමික්ෂනය අනිකුත් නිල්කකුළු ධීවර කර්මාන්තය සිදුකරන අනික් ප්‍රධාන ක්ශේත්‍රයන්( ප්‍රදේශ) හතරෙහිද නිමකරන ලදි. මෙම *නිල් කකුළුවෝ පුවත් හසුන* මගින් ඉහත සදහන් කරනලද සියළුම ක්‍රියාකාරකම් පිලිබද තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමු . තවද මෙම නව පුවත්හසුනේ ආකෘතිය තිරසාර ධීවරකටයුතු පිළිබදව අන්තර්ජාතික වශයෙන් පිලිගත් ප්‍රමිතින් වලට අනුගතවන අයුරෙන් ඉදිරිපත් කිරිමටද අපේක්ෂා කලෙමු

## ජෛව විද්‍යාත්මක තත්වයන් සංවර්ධනය කිරීම



පළමුවෙන්ම හදුනාගෙන ඇති පරිදි මෙම ක්‍රියාවලියේදී ස්තිරසාර තත්වය පිලිබදව තීරනාත්මක සාධකය වන්නේ නිල් කකුළු ධීවර කර්මාන්තය ආශ්‍රිත ජෛව විද්‍යාත්මක පරිසරය සංවර්ධනය කිරිමය . එෆ්අයිපී වැඩසටහන යටතේ පසුගිය වසර අවසානයේදි මන්නාරම් බොක්ක සහ පුත්තලම කලපුව ආශ්‍රිත සතුන්ගේ දිග සහ බර ප්‍රමාණය ගනනය කරමින් ඒ මත පදනම්වූ සතුන්ගේ බෝවිමේ හැකියාව පිලිබද පරයේක්ෂන කටයුතු නිමකරන ලදි. එවගේම මෙම වසරේ පෙබරවාරි සහ මාර්තු මාස වලදි මෙම පරයේක්ෂන කටයුතු පුනරීන් ධීවර සමූපකාර සංගමයේ මැදිහත්වීම තුළින් කිළිනොච්චි සහ මන්නාරම යන කලාප වලට අයත්වන බෙන්ගාලබොක්ක මුහුදු කලාපය තුලද සිදුකරන ලදි. මෙම ක්‍රියාවලිය සදහා තාක්ෂණික සහයෝගය දක්වන ලද්දේ මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමය මගින්ය.(SEALS) නවද නාරා ආයතනයේ මැදිහත්වීම තුලින් යාපනයේ පෝක් සමුද්‍රසංධිය ආශ්‍රිත මුහුදු කලාපයේ මෙම පරයේෂන කටයුතු අඛණ්ඩවම සිදුකරනු ලබයි. (පහත තොරතුරු පරීක්ෂා කරන්න)




### අල්ලාගත් ප්‍රමාණය කොපමණද?

මෙම( පරීක්ෂණය) තක්සේරු කිරීම පෝක් සමුද්‍ර සංධිය කලාපයේ සිදුකරන ලදි. මෙය සදහා පුත්තලම මන්නාරම පුනරීන් යන කලාප වල ධීවර ප්‍රජාව වීසින් අපවෙත සහයෝගය ලබාදෙනලද අතර මෙසේ රැස්කරනලද දත්ත විශ්ලේෂණය කරන ලද්දේ මෙම දිග සහ බර මැනීම තුලින් බෝවීමේ අනුපාතය ගනනය කරනු ලබන සුවිශේෂිත පරිඝණක මෘදුකාංගයක් උපයෝගිකරගනිමින්ය. මෙම පරයේක්ෂන ක්‍රීයාවලිය සදහා මුලුමනින්ම පාදක කරගන්නා ලද්දේ බටහිර ඕස්ට්‍රේලියාවෙහි ***මුඩාශ් වීශ්ව විද්‍යාලයේ ආචාර්‍යය ජෙරම් ප්‍රින්ස්*** නායකත්වය උසුලනු ලබන ධීවර පරයේක්ෂන සහ සංවර්ධන ආයතනයේ මූලිකත්වයෙනි.

කකුළුවන්ගේ බෝවිමේ අනුපාතය පිලිබදව කරනලද පරයේක්ෂනයේ ප්‍රතිඵල සලකා බලනකල මන්නාරම බොක්ක සහ පෝක් සමුද්‍ර සන්ධිය යන ප්‍රදේශ වල එම අනුපාතය යහපත් මෙන්ම සතුටුදායක ' අගයක් ගන්නා පෙනී ගියේය (දකුණුපස විස්තර දැක්වෙයි) මෙම විශ්ලේෂණය සදහා ප්‍රධාන වශයෙන් පාදක කරගෙන තිබෙන්නේ කකුළුවන්ගේ ජීවන කාලය පිලිබද තොරතුරුය. (උදාහරණ එම්/කේ = 1'5 : එල් $_{50}$ = 95 මිමි: එල් $_{95}$ = 135: එල් = 170 මිමි සහ $^{\beta}$ =3) යන ඕස්ට්‍රෙලියානු ***මුඩාශ් වීශ්ව විද්‍යාලයේ ආචාර්‍යය ඇඩ්‍රින් හාඩියෝක්*** මහතා වීසින් ප්‍රකාශයට පත්කර තිබෙන පරයේක්ෂන ක්‍රම යොදාගනිමින්ය.

| කකුළුවන් බෝවිම කලාප | පරයේෂිත ගනන | ඔස් පී | සී එල් |
|---|---|---|---|
| **මන්නාරම බොක්ක** | | | |
| පුත්තලම කලපුව | 3,115 | 59% | 2.2% |
| **බෙන්ගාල බොක්ක** | | | |
| *මන්නාරම* | 2,015 | 39% | 0.8% |
| *කිලිනොච්චි* | 4,087 | 54% | 0.4% |
| *යාපනය* | 5,902 | 61% | 0.4% |

| තීරනාත්මක ලක්ය | සාමාන්‍ය බෝවීමෙ අනුපාතය |
|---|---|
| තීරනාත්මක ලක්ෂය | 20% |
| පහලම සීමාව ( ඉලක්ක ගත) එම් වයි එස් | 30% |
| ඉහලම සීමාව ( ඉලක්ක ගත) එම් වයි එස් | 40% |
| ආරක්ෂක වයි එස් / එෆ් ඊ වයි | 50% |
| *ආරක්ෂන / නිවැරදි එස් පි ආර* | *60%* |

නාරා ආයතනය මගින් මන්නාරම බොක්ක සහ බෙංගාල බොක්ක යන මුහුදු සිමාවන් වලද මෙම කකුළුවනගේ ජෛවවිද්‍යාත්මක ගහනය සහ බෝවීමෙ අනුපාතය ගනනය කිරීමේ සම්ක්ෂනයක් පවත්වන ලද අතර එම පරයේක්ෂන තොරතුරු පහත දක්වමු මෙම අතරතුර කාලයේදීම ප්‍රාදේශීය වශයෙන් එෆ්.අයි.පී (FIP) වැඩසටහන සිදුකරනලද පරයේක්ෂන වලින්ද ලබාගත් ඉහත දැක්වූ ප්‍රතිඵලම ලබාගත් අතර එම ප්‍රතිඵල (දකුණු පස වගුව පරීක්ෂා කරන්න) අනුව මෙකී බෝවිමෙ අනුපාතය සතුටුදායක තත්වයක පවතිනබව තහවුරු වන්නේය. ඒ අනුව මෙම පරීක්ෂන ක්‍රියාවලියට ලක්කරනලද මන්නාරම බොක්ක සහ බෙංගාල බොක්ක යන මුහුදු සිමාවන් වලද මෙම කකුළුවනගේ ජෛවවිද්‍යාත්මක ගහනය සහ බෝවීමෙ අනුපාතය **ඉහලම සීමාව (ඉලක්ක ගත) එම් වයි එස් (MSY)** හෙවත් උපරිම ආර්ථික පලදායී තාවයක් සහිත ලක්ෂයක් ලෙස දැනට පවතින බව සදහන් කලහැකිය. මන්නාරම බොක්ක මුහුදේ සහ බෙන්ගාල බොක්ක කලාපයේ එස් පි ආර් අගය නිරවද්‍ය තාවය තහවුරු කරගැනීම සදහා නාරා ආයතනය නැවත වරක් එම ජෛව විද්‍යාත්මක පරයේක්ෂණය සිදුකරන ලදි. මෙම පරයේක්ෂනයෙන්ද තහවුරු කරගනුලැබුයේද ඉහත සදහන් ප්‍රදේශවල දැනට ක්‍රියාත්මක න්ල්කකුළුවන්ගේ බෝවීමේ අනුපාතය සතුටුදායක තත්වයක පවතින බවය. මෙම පරයේක්ෂණයෙන් තවදුරටත් හවුරු වුයේ මන්නාරම් බොක්ක් ආශ්‍රත ප්‍රධාන න්ල්කකුළු ධීවර කර්මාන්තය කරනු ලබන කලාප 3 තුල අපේක්ෂිත තත්වයටත් වඩා ඉහල අගයක මෙම බෝවීමේ අනුපාතය පවතින බවය .



නාරා ආයතනයේ සාගරසම්පත් කළමනාරන අංශයේ ප්‍රධානී ආචාර්ය්‍ය සිසිර හපුතන්ත්‍රි මහතා සහ එතුමාගේ කාර්යමණ්ඩලය එක්ව යාපනය දිස්ක්‍රික්කයේ ධීවර කලාප හතරක් තෝරාගනිමින් කකුළුවන් 18000 ක් පරයේක්ෂනයට භාජනය කරන ලදි. එවගේම 400 ක් පමන කකුළුවන් රසායනාගාරය වෙත රැගෙනගොස් මෙම පරයේක්ෂන කටයුතු තවදුරටත් සිදුකරන ලදි. සිසිර හපුතන්ත්‍රි මහතා විසින් සිදුකල මෙම පරයේක්ෂන ක්‍රියාවලිය සදහාද ප්‍රධාවන වශයෙන් පාදක කරගනු ලබුවේද සතුන්ගේ දිග ප්‍රමානය සහ බර ප්‍රමාණය අතර පවතින සහ සම්බන්දය; වර්ධන සිග්‍රතාවය ; බිත්තර දැම්ම සදහා පරිනතවිමේ සීග්‍රතාවය ; එම අවස්තාවෙහි පැවති බර සහ ගැනුසතාගේ සරුබව (ප්‍රජනන ශක්තිය) අදාල කාලය තුල බෝකිරිම සදහා ඇති දක්ෂතාවය (බිජුදැමීමෙ හැකියාව) සහ ආහාර යනාදි කරුනුය. නාරා ආයතනය මගින් ඉටුකල මෙම පරීක්ෂණයේ අතුරු වාර්ථාව ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමයවෙත පසුගිය ජුනිමාසයේදී ලබාදුන් අතර අවසන් වාර්තාව 2015 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රථමයෙන් ඉදිරිපත් කිරිමට නියමිතය.

2015 ජුනි මාසයේදි ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අවසන් වසරෙහි ඉගෙනුම ලබන අයන්ත අබේගුණවර්ධන සිෂ්‍යාවෙතින් නිල්කකුළුවන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය පිළිබදව පරයේක්ෂනයක් ආරම්භ කරන ලද අතර එය මන්නාරම දිස්ත්‍රික්කයතලූ මාස 3 ක පමණ කාලයක් තුල සිදුකිරිමට නියම්තය 'ඔහුගේ මෙම පරයේක්ෂන කටයුතු අධීක්ෂනය කරනු ලබන්නේ එම විශ්වවිද්‍යාලයේම සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම විද්‍යා පීඨයේ පීඨාධිපති වරිය වන සේපාලිකා ජයමාන්න මැතිණිය විසින්ය. මෙම කටයුතු සදහා වැයවෙන ගමන් වියදම් ඇතුලු අනිකුත් පිරිවැය (FIP) එෆ් අයි පී වැඩසටහව මගින් ලබාදෙන ලදි. මෙහි ඡායාරූපයක් දකුණු පසින් පලතොට ඇත.



## ධීවර කටයුතුවලට අදාල පාරිසරික සාදක සහ තත්වයන් සංවර්ධනය කිරීම

අන්තර්ජාතික ආයතන දැනට තිරසාර ධීවර සංවර්ධනය උදෙසා වැඩි ප්‍රමුඛතාවයක් දක්වන බව පෙනෙන්නට ඇත. ඒ අනුව මොන්ටරි බේ සීෆුඩ් සමාගම සහ අන්තර්ජාතික සාගර භාරකාරත්ව සංගමය යන ආයතන මගින් මෙම පාරිසරික විද්‍යාත්මක අද්‍යන ක්‍රියාවලිය පියවර තුනකින් දැනට සිදුකරනු ලැබේ. පළමුව මොවුන් වීසින් ඉලක්ක කරනු ලබන්නේ ප්‍රයෝජනයට ගත නොහැකි මත්ස්‍ය සම්පත හෙවත් බයිකැච් පිලිබදවය. දෙවනුව ඔවුන් ගේ අවධානය යොමුව ඇත්තේ සතුන්ගේ සාගර වාසස්ථාන (උදාහරණ කඩොලාන පරිසරය කොරල් රීප් සහ මුහුදු පැළෑටි) වීශේෂ ආදිය පිලිබදවය. අවසාන වෂයෙන් මොවුන්ගේ අවධානයට සහ තක්සේරුවට යොමුවන්නේ වත්මන් ධීවර ක්‍රියාකාරකම් සාගර පාරිසරික පද්දතින් කෙරෙහි කෙසේ බලපෑම් කරන්නේද යන කරුන පිළිබදවය. පසුගිය මැයිමාසයේදී පමන එෆ් අයි පී (FIP) වැඩසටහන මගින් පාරිසරික බලබෑම තක්සේරු කරන සැලැස්ම දල වශයෙන් පිලියල කරන ලද අතර මෙයට ඌව වෙල්ලස්ස සරසවියේ සත්ව වීද්‍යා සහ අපනයන කෘෂිකර්ම පාඨමාලාව හදාරන අවසන් වසරෙ සිසුන් සහභාගි වුහ තවද එෆ් අයි පි(FIP) වැඩසටහන තංගල්ල සාගර වීශ්වවීද්‍යාලය වෙත ගොස් එෆ් අයි පි ව්‍යාපෘති කාරය්‍ය මන්ඩලය සහ එම සාගර සරසවීයේ සිසුන් සදහාද මෙයට අදාල දේශණයත් පවත්වන ලදි මෙම දේශන සහ වැඩමළුව මගින් අපේක්ෂා කරන ලද්දේ මෙම පාරිසරික තත්වයන් පිලිබදව කරනු ලබන අධ්‍යන කටයුතු සදහා මෙම සියලුම පාර්ෂවයන්ගේ දායකත්වය පලදායි ලෙස ඉදිරි කාලයේදි ලබා ගැනීමය.



උෟව ලේලස්ස සරසවියේ අවසන් වසරෙ තවත් එක් සිසුවෙකු වන වසන්න දොලවත්ත විසින 2015 ජුනි මාසයේදි ' පෙර සදහන් කරන ලද බයිකැච් විළිබද සහ එතුලින් මෙම නිල් කකුළු ධීවර කර්මාන්තය සදහා ඇතිකරන අහිතකර බලපෑම පිලිබද අද්‍යන කටයුත්තක් පටන්ගන්නා ලදි. ඔහුගේ මෙම පරයේක්ෂන කටයුතු අධීක්ෂනය කරනු ලබන්නේ එම විශ්වවිද්‍යාලයේම සත්ව විද්‍යා සහ අපනයන කෘෂිකර්ම විද්‍යා පීඨයේ පීඨාධිපති වරිය වන සේපාලිකා ජයමාන්න මැතිණිය විසින්ය.




අගෝස්තු මාසයේදී පමණ සාගර විශ්ව ද්‍යාලයේ අවසන් වසරෙ ඉගෙනුම ලබන එරංග ගුණසේකර සිසුවා විසින් බයිකැච්(bycatch) ආශ්‍රිත තවත් පරයේක්ෂණයක් පුත්තලම තලපුව ආශ්‍රිත ඉටුකිරීමට අදහස් කර ඇති අතර මෙම පරයේක්ෂනය මෙහෙයවනු ලබන්නේ සාගර විශ්වවිද්‍යාලයේ සේවය කරන ආචාරය්‍ය ෆයිරූස් මහතා විසින්ය. ඒ අනුව(SEASL) මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමය මෙම සෑම පරයේක්ෂන කටයුත්තක් සදහාම එෆ් අයි පී වැඩසටහන යටතේ සහයෝගය ලබාදීමට අදහස් කරඇතිබව සතුටින් සදහන් කරම. ඒ අනුව දිගින් දිගටම සරසවි සිසුන්ගේ පරයේක්ෂන කටයුතු වලට අතහිත දෙමින් ශ්‍රී ලංකාව තුළ නිල් කකුළුවන් ආශ්‍රිත ධිවර කර්මාන්තය සංවර්ධන කිරීම පිණිස ඔවුන්ගේ පූර්ණ සහයෝගය මෙන්ම දායකත්වය ලබාගැනීමට අප නිරන්තරයෙන්ම උත්සුක වෙම.


## නිල්කකළු ධීවර කටයුතු කලමනාකරනය සහ වැඩිදියුණු කිරීම

මෙමගින් ධීවරයාගේ අස්වැන්න කළමනාකරණ වැඩපිලිලෙක් සැකසීමට අදහස්කරඇත. මෙය ක්‍රියාත්මක කිරීම සදහා සරළ මෙන්ම පලදායි පාරිසරික හිතකාමි ක්‍රමෝපායන් යොදාගැන්මට අපේක්ෂිතය. තවදුරටත් සදහන්කරන්නේනම් මෙම කර්මාන්තය තිරසාර ලෙස දිගින්දිගටම පවත්වාගෙන යාම සදහා අස්වැන්න කළමනාකරන ක්‍රමයක් දැඩිලෙසින්ම අවශ්‍යවනබව සදහන් කලයුතුය' මෙනිසා සහභාගිත්ම කලමනාකරන ක්‍රමවේදයට අනුගතව මෙම කටයුතුද සංවර්ධනය කිරීමට අදහස්කර ඇත. මෙම කටයුතු නිම ක කිරීම පිනිස එෆ් අයි පි වැඩසටහන නව අස්වනු කලමනාකරන මෙවලම් කිහිපයක් ජනතාවට හදුන්වා දීමට අදහස්කර ඇත්තෙමු . මෙම කටයුතු වඩාත් සාර්තක බරගැනිම පිණිස ධීවර ජනතාවගේද සහයෝගය ලබාගැනීමට අතයාවශ්‍යවන දෙයකි එයට හේතුව ලෙස සලකන්නේ දිගු කලක්තිස්සේ මොවුන් සතු අත්දැකිම් සහ පලපුරුද්ද මෙම වැඩපිලිවෙලට යොදාගැනිම වැදගත්වන හෙයින්ය.

| කලාපය | ධීවරයින් ගනන | තොටුපල ගනන | යාත්‍රා ගනන |
|---|---|---|---|
| **මන්නාරම** | | | |
| පුත්තලම | 1,744 | 35 | 1,027 |
| **පබන්ගාල බොක්ක** | | | |
| මන්නාරම | 1738 | 17 | 603 |
| බිලිනොÑච් | 310 | 6 | 155 |
| යාපනය | 432 | 19 | 696 |
| | **4,224** | **77** | **2,481** |

ජුනිමාසයේදී ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන දෙපාර්ථමෙන්තුව බෙන්ගාල බොක්ක පාරිසරික සංවර්ධන වැඩසටහනේ මුල්‍ය අනුග්‍රහය ලබාගෙන ධීවර කටයුතු ආශ්‍රිත මුලික දත්ත රැස්කිරීමෙ සම්ක්ෂන කටයුතු දිවයිනේ දිස්ත්‍රික්ක හතරක් තුල නිම කරනලදි. මෙයට තාක්ෂනික වශයෙන් සහාය දක්වන ලද්දේ එම දෙපාර්ථමෙන්තුවෙහි ජෙෂ්ඨ අපදේහක වරයෙකු වන ලෙස්ලි ජෝසප් මහතාය. මෙම ප්‍රශ්නාවලිය සම්පාදනය කරන ලද්දේද එෆ් අයි පී වැඩසටහන යටතේය.තවද මෙම සමීක්ෂනය ධීවර සමුපකාර සමිති 77 ක් සම්බන්ද කරගනිමින් නිමකරන ලදි. එම තොරතුරු ඉහත සදහන් වගුවෙහි ඇතුලත්කර තිබේ.මෙම සමීක්ෂනයෙන් අනතුරුව ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන දෙපාර්ථමෙන්තුව සමග එකතුවෙන් කලමනාකරණ සැලැස්ම පිලියල කිරීමට අදහස්කර ඇත. මෙයට වයඹ විශ්වවිද්‍යාලයේ ධීවර අංශයේ සේවය නියුතු ආචාරය්‍ය සෙව්වන්දි ජයකොඩි මහත්මියගේ තාක්ෂණික සහයෝගය ලබාගැනීමට අපේක්සෂිතය. මෙහි ප්‍රධාන මෙලම් ලෙස යොදාගැනීමට අදහස් කර ඇත්තේ බෙන්ගාල බොක්ක පාරිසරික සංවර්ධන වැඩසටහනට අදාලවන නිර්නායකයන්ය.

දැනට පවතින තවත් ප්‍රභල ගැටළුවක් ලෙස සදහන් කලහැක්කේ දකුණු ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා හරහා මෙරට දියඹ තුල සිදුකරනු ලබන අනවසර ධිවර කටයුතුය. එෆ් අයි පි වැඩසටහන උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මත කිරීමේදි බලපා තිබෙන ප්‍රධාන ප්‍රශ්ණයක් ලෙස මෙම ගැටලුව දැනට අපවිසින් හදුනා ගෙ ඇත .සෑම සතියකදීම දිනතුනක් තුල මෙම ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා 700 ක් පමන මෙම අන්තර්ජාතික මුහුදු සිමාව අල්ලන්ඝනය කම්රන් මෙරට මුහුදු කලාපයට ඇතුල්වන අතර නිත්‍යානුකුල නොවන අයුරින් එම යාත්‍රා මසුන් ඇල්ලිම සිදුකරනු ලබති. (අදාල සිතියම පරීක්ෂා කරන්න .මෙම ගැටළුව පිලිබදව ඉන්දියානු සහ ශ්‍රීලංකා රජයන් කොපමන ප්‍රමාණයක් රාජ්‍ය තාත්ත්‍රික පවත්වා තිබුනත් මෙතෙක් එම ගැටලු සමතයකට පත්ව නොතිබිම ඉතාමත්ම කනගාටුදායක තත්වයකි මෙම තත්වය තුල දැනට උතුරු ප්‍රදේශයේ වෙසෙන ශ්‍රි ලාංකික ධීවරයින් සතු අතිවිශාල මත්ෂ්‍ය සම්පතක් අතිමහත් විදේශවිණිමය ප්‍රමානයක් මෙම ක්‍රියාවලිය තුලින් අපරටට අහිමි වෙයි.. තවද මෙම අනවසර සහ නහනම් ට්‍රෝලරින් ක්‍රියාවලිය හරහා මුහුදු පතුලෙහි සාගර පාරිසරික පද්ධතින් වලට දැඩිලෙස අහිතකර බලපෑමක් එල්ලවී තිබෙ.



At 1.00 a.m. Sri Lankan territorial waters are fully dense with Tamil Nadu trawlers

පසුගිය  පසුගිය මාර්තු මාසයේදී චන්දික ජයවර්ධන - චින්තක ප්‍රනාන්දු සහ උපේන්ද්‍ර ගුණසේකර යන  නිතීඥ වරුන් මගින් මෙම ඉන්දියානු අනවසර සහ නීතියට පටහැනි මසුන් අල්ලන ට්‍රෝලර්යාත්‍රා වලට එරෙහිව  ඇපැල් උසාවියේ නඩුවක් ගොනු කරන ලදි. පසුව මෙම නඩුව පිළිබදව වැඩි දුරටත් සලකා බැලීම සඳහා  උසාවිය තීරණය කරන ලද්දේ නීතිපති උපදෙස් ලබාගතයුතු බවය. මෙම තත්වය තුල උතුරෙහි ධීවර ප්‍රජාව විසින් මෙම පෙත්සම  සුප්‍රිම් උසාවිය දක්වා ඇලයක් මගින් ඉදිරිපත් කිරමට තීරණය කර ඇති අතර එය ජුලිමස 10 වනදින ඉදිරිපත් කිරිමට නියමිතය.





එවගේම ශ්‍රී ලංකාවේ ධීවරයන් විසින් සිදුකරනු ලබන තහනම් දැල් පන්න  ක්‍රමද දැනට නිල් කකුළු ධීවර කර්මාන්තය සඳහා ප්‍රබල තර්ජනයක් බවට පත්ව ඇත. තවද ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා සඳහා  සතියකට දින 3 ක් පමනක්  මෙම ට්‍රෝලර් යාත්‍රා භාවිතා කිරිමට අවසර දී තිබෙන  නීතිය බලගැන්වීම තුලින් මෙරට ධීවරයින් සදහා  විශාල අගතියක් සිදුවන බව පෙනීගොස් ඇත . මෙම තත්වය තුල  මෙරට ධීවර ප්‍රජාව තහනම් දැල්පන්න භාවිතා කිරිමට  වැඩියෙන් පෙලබී ඇත . තවද ශ්‍රී ලංකා ධීවරයින් වීසින් සිදුකරනු ලබන යාන්ත්‍රික  ට්‍රෝලර් මගින්ද  සිදුකරනු ලබන  මෙම තහනම් පන්න හරහා විශාල පාරිසරිනක හානියක් සිදුවෙමින් පවතියි. මෙම තත්වය තුල මෙරට යාන්ත්‍රික ට්‍රෝලර් සහ තහනම් පන්න  භාවිතා කිරිම පිටුදැකීමට  සදහා 1996 අංක 04 දරණ  ගංගා කලපු සහ මෝය ප්‍රදේශ ආශ්‍රිත යාන්ත්‍රික ට්‍රෝලර් යාත්‍රා තහනම් කර ඇතිබව සදහන් ගැසට් නිවේදනයේ සදහන් කරුනු බලගැන්වීම සදහා අවශ්‍ය පියවර ගැනීම සදහා වැඩපිලිවෙලක්  සැකසීමට අපේෂාකර ඇත. මෙයට අදාලව එම් ඒ සුභන්දිර මන්ත්‍රිවරයා වෙත වෙරිටේ රිසර්ච්  ආයතනය මගින්  යොජනා කර ඇත්තේ  මෙම පනත තවදුරටත් බලගැන්වීම එයට සංශෝධනයක් කලයුතු බවය. මෙම සංශෝධනයෙන් අපේක්ෂා කරනුලබන්නේ දේශිය වශයෙන් යාන්ත්‍රික ට්‍රෝලර් භාවිතය නවතා දැම්ම සදහා අවශ්‍ය පියවර ගැනීමය.

පසුගිය ජුනි මාසයේදී  මෙරට ප්‍රධාන මුහුදු ආහාර අපනයනය කරනුලබන සමාගම් 5 ක් වන **තැප්‍රබේන් ශීෆුඩ්**, **ඇල්පෙක්ෂ් මැරීන් ප්‍රොන් සිලෝන්  සිලෝන් කැච් සහ ඇල්පෙක්ස්** මැරීන් යන සමාගම්  විසින් ඒකාබද්ධව ඉන්දියානු සහ ශ්‍රී ලංකා යන දෙරටෙහිම ධීවරයින් විසින් සිදුකරනු ලබන විනාශකාරී ට්‍රෝලර් යාත්‍රා යොදාගනිමින් සිදුකරනු ලබන ධීවර කටයුතු  තහනම් කරනලෙස ඉල්ලා සිටිමින්  පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත පෙත්සමක්  සකස්කර ඇති අතර එම පෙත්සම 2015 අගෝස්තු මාසයේදි  පැවැත්වෙන මහ මැතිවරණයෙන් පසුව ඇරබෙන නව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිමට සැලසුම් කර ඇත. තවද ඌව වෙල්ලස්ස සරසවියේ සත්ව විද්‍යා අංශයේ අවසන් වසර අධ්‍යාපනය ලබන  එම් බි සොසෙල් සිෂ්‍යා වීසින් ආරම්භ කරඇති තවත් පරයේක්ෂනයක් වන්නේ ඉන්දියානු අනවසර ට්‍රෝලර් යාත්‍රා මෙරට මුහුදු සීමාව තුල මසුන් ඇල්ලිම  නිසා  මෙරට සාම්ප්‍රධායික සුළු පන්න ධීවරයින් හට සිදුවන අහිතකර බලපෑම කවරේද තක්සේරු කිරිම වන අතර මෙම පරයේෂණ කටයුතු සදහා ඔහු තෝරාගෙන ඇත්තේ මන්නාරම ප්‍රදේශයයි .මෙම පරයේක්ෂන ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලබන්නේ  එම විශ්වවිධ්‍යාලයේම ප්රෙයක්ෂණ නිලධාරියෙකු වන පී.පී.එල් නුවන් මහතා වීසිනි.

පසුගිය මාර්තු මාසයේදි මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමය (SEASL) වෙත ක්ලැෂික් ලිස්ක් සහතික කරන අන්තර් ජාතික ආයතනයේ නියෝජිත වරියක් ශ්‍රී ලංකාවට පැමිනි අතර ඇය වීසින් මෙම එම් එස් සී සහතික කිරිමේ ක්‍රියාවලිය පිළිබද වැඩමුලුවක්  එෆ් අයි පි වැඩසටහන සමග අත්වැල් බැදගනිමින් පවත්වන ලදි. මෙය දින දෙකක වැඩමුලුවක් වු අතර 30 දෙනෙකු පමණ මේ සදහා සහභාගි වීය ඒ අතරට මෙම ප්‍රධාන අපනයන සමාගම්වල සේවය කරන ජෙෂ්ඨ නිලධාරින්, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන දෙපාර්ථමේන්තු නිලධාරින්, නාරා ආයතනයේ නිළධාරින් සහ  විශ්ව විද්‍යාල සිසුන්ද සහභාගිවුහ.




*2015 ඉදිරි ක්‍රියාමාර්ග*  මෙතෙක් සදහන් කරන ලද සියලුම කටයුතු නිමකිරිම සදහා මුල්‍ය සහ තාක්ෂණික සම්පත් ඉතාමත්ම වැදගත් වු අතර  මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමය.මෙයට අමතරව  උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන්වන  අන්තර් ජාතික කම්කරු සංවිධානය මගින් දියත් කර තිබෙන ප්‍රජා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (කිලිනොච්චිය ධීවර සංගමය) බෙන්ගාබොක්ක සංවර්ධන වැඩසටහන (ධීවර දෙපාර්ථමෙන්තුව) යන වැඩසටහන්ද වැදගත්වන බව සදහන් කලයුතුය. ඒ අනුව තවදුරටත් මෙම වැඩසටහන් ඉදිරියට පවත්වාගෙන යාම පිණස  මෙම සෑම වැඩසටහනකම සහය මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමය සහ එෆ් අයිපි වැඩසටහන වෙත ලැබෙන බවද සදහන් කරමු.

*මෙම පුවත් හසුනෙහි 1,2,3 යන විද්‍යුත් පිටපත්  සිංහල දමිළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ වෙබ් පිටුවෙහි දක්වා අති අතර මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමය පිලිබද  සියලු තොරතුරු සදහා  (උදාහරන : සැලසුම්, වැඩසටහන්, අයවැය සහ කාර්යය දර්ශක) [www.seasl.lk](http://www.seasl.lk) පිවීසෙන්න. 2015 ජුලි වලින් පසුව විද්‍යුත් තැපැල oddfish@slt.lk*